"කාර්යක්ෂමතාවයෙන් යුත් ඵලදායි පළාත් සභා රාජ්‍ය සේවයක්"

ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව
ஊவா மாகாண சபை அரசாங்க சேவை ஆணைக்குழு
Uva Provincial Council Public Service Commission

අංක 14/4, පීලිපොතගම පාර,පිංඅරාව බදුල්ල. இல 14/4,பீலிபொத்தகம வீதி,பிங்கராவ,பதுளை. No 14/4,Peelipothagama Road, Pinarawa,Badulla.

මගේ අංකය / எனது இல / My No. 3/1A/1/10 ඔබේ අංකය / உமது இல / Your No. ................ දිනය / திகதி / Date 2023.06.09

<u>ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 10/2016 (I)</u>

ඌව පළාතේ ප්‍රධාන ලේකම්,

ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්,

ඌව පළාත් සභා ලේකම්,

ඌව පළාතේ සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්,

ඌව පළාත් සභා සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්,

ඌව පළාත් නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ ආයතන ප්‍රධානීන්,

<u>කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන සැලසීම</u>

උක්ත මැයෙන් 2016.12.14 දිනැතිව නිකුත් කර ඇති ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 10/2016 හා බැඳේ.

02. එහි 04 , 06 සහ 07 ඡේද පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

" 04. මෙහිදී දැනට වසරකට දෙවරක් කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ පැවැත්වීම සම්බන්ධ විධිවිධාන සඳහන් කර නොමැති ඌව පළාත් සභා රාජ්‍ය සේවයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටි හා සේවා ව්‍යවස්ථාවල ඒ සම්බන්ධ සංශෝධනයන් ඇතුලත් කර අනුමත කරවා ගැනීමට කඩිනමින් කටයුතු කරන ලෙස දන්වා සිටිමි."

"06. කෙසේ වුවද උක්ත 03 ඡේදයේ විධිවිධාන අදාළ වනුයේ ලිඛිත, වාචික හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා පමණි. හැකියා ප්‍රවර්ධනය වැනි පාඨමාලා කාර්යක්ෂමතා කඩඉම ලෙස සේවා ව්‍යවස්ථා හා බඳවා ගැනීමේ පරිපාටිවල සඳහන්ව ඇති නිලධාරීන්ගේ අදාළ කාර්යක්ෂමතා කඩඉම සම්බන්ධයෙන් වන සහන ඉල්ලීම සඳහා නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 02/2011 (I) අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය."

ගරු සභාපතිතුමා / கௌ.தவிசாளர் / Hon. Chairman 055 - 2222150
ලේකම් / செயலாளர் / Secretary 055 - 2223482
පොදු / பொது / General 055 - 2222400, 055 - 2231460 (Exam Unit)
සහකාර ලේකම් / உதவி செயலாளர் / Asst.Secretary 055 - 2225148, 055 - 2232857
පරිපාලන නිලධාරී / நிர்வாக உத்தியோகத்தர் / Administrative Officer 055 - 2222400
Fax - 055-2232858
Website - www.psc.up.gov.lk
E-mail - uppscb@gmail.com

"07. තවද ඉහත විධිවිධාන යටතට නොගැනෙන වෙනත් කාර්යක්ෂමතා කඩඉම් සම්බන්ධයෙන්ද වන සහන ඉල්ලීම් සඳහා නිර්දේශ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 2/2011 (I) අනුව ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතුය."

03. මෙම සංශෝධන ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 10/2016 චක්‍රලේඛය යටතේ මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ගයන්ට අගතියක් නොවන පරිදි 2016.12.14 දින සිට ක්‍රියාත්මක වන බවද දැනුම් දෙමි.

කොමිෂන් සභාවේ නියමය පරිදි,

(එච්.එම්.ජීවන්ත හේරත්)
ලේකම්
ඌව පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පිටපත්:

1. සහකාර විගණකාධිපති, රජයේ විගණන කාර්යාලය, බදුල්ල - දැ.ගැ.පි.
2. අභ්‍යන්තර විගණන අධ්‍යක්ෂ, ඌව පළාත් සභාව - දැ.ගැ.පි.